**තේමාව** - ජලය

**විෂය** - ගණිතය

**පන්තිය** - 6 ශ්‍රේණිය

**පාඩම** - 16. ද්‍රව මිනුම්

**අරමුණු** -

- මිලි ලීටර හා ලීටර වලින් දී ඇති ද්‍රව ප්‍රමාණ එකතු කිරීම හා අඩු කිරීම.

**නිපුනතාව** -

- දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද්‍රව මිනුම් පිළිබඳ විචාරශීලිව කටයුතු කරයි.

**නිපුනතා මට්ටම** -

- දෛනික කටයුතු වලදී ද්‍රව ආශ්‍රිත මිනුම් යොදා ගනියි.

---

1. **පෙර ඉගෙනුම -**
   1. ද්‍රව ප්‍රමාණ එකතු කිරීම පාඩමේ ඇති නිදසුන හොඳින් කියවන්න.
   2. ඒ ආකාරයට පළතුරු යුෂ හා ජලය එකතු කර පළතුරු බීමක් සාදන්න.
   3. මුළු පළතුරු බීම ප්‍රමාණය කොපමණ දැයි ද්‍රව මැනිය හැකි උපකරණයක් භාවිතයෙන් මැන ගන්න.
   4. නිවසේදී ජලය හෝ ද්‍රව එකතු කිරීමට සිදුවන අවස්ථා සටහන් කරන්න.

2. **පන්ති කාමර ඉගෙනුම -**
   1. අභ්‍යාසය 16.3 ඉටුකරයි.(කණ්ඩායම් ලෙස)
   2. මිලි ලීටර හා ලීටර අඩංගු එකතු කිරීම් වලදී මිලි ලීටර 1000 ඉක්මවූ විට ලීටර දෙසට ගෙන ය යුතු බව හඳුනා ගනියි.
   3. අභ්‍යාසයේ ඇති ගැටළු සාකච්චා කරයි.
   4. ද්‍රව ප්‍රමාණ අඩු කිරීම සම්බන්ධ නිදසුන් සාකච්චා කරයි.

3. **පසු ඉගෙනුම** -
    I. අභ්‍යාසය 16.4  ඉටුකරයි.

    II. නිවසේ ඇති විවිධ ද්‍රව වර්ග භාවිත කිරීමේදී අඩුවන ප්‍රමාණ පිළිබඳව අධ්‍යනය කරයි.

4. **කේවල** -
    I. නිවසේ ජල ටැංකියේ ඇති ජලය පරිභෝජනය කල පසු ඉතිරි ජල ප්‍රමාණය ලබාගන්නා ආකාරය අනාවරණය කරගත හැකි ආකාරය විමර්ශනය කර වාර්තාවක් සකසන්න.

    II. වාර්තාව සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මත වාර්තාව පරික්ෂා කර ගුරුතුමියට ඉදිරිපත් කරයි.

    III. නිවසේ ජල ටැංකියේ ධාරිතාව පිළිබඳව විමසන්න.

5. **පොදු** -
    I. පන්තිය කණ්ඩායම් අනුව පාසලේ ඇති ජල ටැංකි ප්‍රමාණය හා ඒවා තුල එක්රැස් කල හැකි මුළු ජාල ප්‍රමාණය පිළිබඳව ගණනය කිරීම් කර දිනකදී පාසල තුල පරිභෝජනය වන ජාල ප්‍රමාණය කොපමණද හා ඉතිරි වන ජල ප්‍රමාණය කොපමණ දැයි දළ වශයෙන් වාර්තාවක් හදන්න.

6. **පාඩම ඉගෙනීමට අවශ්‍ය සහය** -

    i. නිවසේ ඇති ද්‍රව මැනිය හැකි උපකරණ

    ii. ජලය එක්රැස් කරගත හැකි ටැංකිවල ධාරිතාව

    iii. 6 ශ්‍රේණිය ද්‍රව මිනුම් පෙර ඉගෙනුම් කාර්ය පත්‍රිකා

    iv. E nanapiyasa 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්

    v. https://www.ircwash.org